ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනවේදී නාට්‍ය හා රංගකලා/ ස්වභාවික විද්‍යා ගෞරව
උපාධි වැඩසටහන - 2023/2024
පස්වන මට්ටම
අවසාන පරීක්ෂණය 2024
**STU5511- අධ්‍යාපනික මනෝවිද්‍යාව**
කාලය පැය තුනයි. (03)

---

දිනය - 2024.12.16 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**01 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද 02 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

<u>01 වන කොටස</u>

01. 'අධ්‍යාපන මනෝවිද්‍යාව' ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළට සමෝධානය කරගැනීමේ ඇති වැදගත්කම කරුණු දෙකක් (02) ඇසුරින් පැහැදිලි කරන්න.

02. ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීමේ කාර්යය සඳහා අධ්‍යාපන මනෝවිද්‍යාව පිළිබඳ දැනුම නාට්‍ය හා රංගකලා/ ස්වභාවික විද්‍යා ගුරුවරයෙකු ලෙස ඔබට වැදගත් වන්නේ කෙසේදැයි කෙටියෙන් පෙන්වා දෙන්න.

03. "මනෝවිද්‍යා ක්ෂේත්‍රය තුළ පර්යේෂණාත්මක අධ්‍යයන ක්‍රම භාවිතය අපහසුය" උදාහරණ දෙකක් (02) දක්වමින් මෙම ප්‍රකාශය සාධාරණීකරණය කරන්න.

04. පර්යේෂණාත්මක නොවන අධ්‍යයන ක්‍රමයක් ලෙස ප්‍රශ්නාවලි ක්‍රමයේ ප්‍රබලතා දෙකක් (02) සහ දුබලතා දෙකක් (02) දක්වන්න.

05. පියාජේ (Piaget) විසින් ඉදිරිපත් කරනු ලැබූ ප්‍රජානන සංවර්ධන අවධි අදාල වයස් සීමාවන් සමඟ නම් කරන්න.

06. අභ්‍යන්තර පෙළඹීම සහ බාහිර පෙළඹීම එක් උදාහරණය බැගින් සපයමින් වෙන්කොට දක්වන්න.

07. වැඩීම සහ සංවර්ධනය අතර ඇති සහසම්බන්ධතාවය සුදුසු උදාහරණයක් මගින් කෙටියෙන් පැහැදිලි කරන්න.

08. "සිසුන් සුතත්‍ය ඉගෙනුමෙහි (authentic learning) නිරත කරවීම ඵලදායි ඉගෙනුම් මාරුව සඳහා පහසුකම් සපයයි." ඔබ නාට්‍ය හා රංගකලා/ ස්වභාවික විද්‍යා ගුරුවරයෙකු ලෙස සුතත්‍ය ඉගෙනුම් අත්දැකීම් සැලසුම් කරන්නේ කෙසේදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05x08=40)

<u>02 වන කොටස</u>

09. (i.) අධ්‍යාපන මනෝවිද්‍යාව යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii.) "සෑම ඉගෙනුම් ලාභියෙකුටම අනන්‍ය වූ නැඹුරුතා, ශක්තීන්, හැකියාවන් සහ අභියෝග සමූහයක් ඇත." අධ්‍යාපන මනෝවිද්‍යාවට අනුව මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iii.) ඔබට නාට්‍ය හා රංගකලා/ ස්වභාවික විද්‍යා ගුරුවරයෙකු ලෙස ඉගෙනුම්ලාභීන්ගේ විවිධත්වය සැලකිල්ලට ගනිමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි නිරතවිය හැක්කේ කෙසේදැයි පරීක්ෂා කරන්න. (ලකුණු 08)

10. (i.) ප්‍රාථමික චිත්තවේග තුනක් **(03)** නම් කර ද්විතියික චිත්තවේග ගොඩ නැගීමේදී ප්‍රාථමික චිත්තවේග දෙකක් එකතු කළ හැක්කේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii.) ඩිජිටල් යුගයෙහි ඉගෙනුම්ලාභීන්ගේ චිත්තවේගීය සංවර්ධනයෙහි වැදගත්කම උදාහරණ දෙකක් **(02)** සපයමින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii.) ඉගෙනුම්ලාභීන්ගේ ධනාත්මක චිත්තවේග සංවර්ධනයෙහිලා ඔබගේ භූමිකාව නාට්‍ය හා රංගකලා/ ස්වභාවික විද්‍යා ගුරුවරයෙකු ලෙස සකස් විය යුත්තේ කෙසේදැයි පෙන්වා දෙන්න. (ලකුණු 08)

11. (i.) "තොරතුරු සැකසුම් ආකෘතිය" කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii.) "පාඩමට සිසුන්ගේ අවධානය ලබා ගැනීම සාර්ථක පාඩමක් සිදු කිරීමේදී අනිවාර්ය වේ." නාට්‍ය හා රංග කලා/ ස්වභාවික විද්‍යා ගුරුවරයෙකු ලෙස ඔබගේ සිසුන්ගේ අවධානය ලබා ගැනීමට ඔබට යොදාගත හැකි උපක්‍රම තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii.) ඉහත (ii) යටතේ සඳහන් කළ උපක්‍රමවල ඵලදායිතාව සුදුසු උදාහරණ සපයමින් අගයන්න. (ලකුණු 08)

12. (i.) පිළිගත් නිර්වචනයක් උපුටා දක්වමින් "පෞරුෂය" සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii.) පෞරුෂ සංවර්ධනයට බලපාන සාධක දෙකක් **(02)** විස්තර කරන්න. (ලකුණු 06)

(iii.) ඔබේ සිසුන් තුළ සමබර පෞරුෂයක් සංවර්ධනය කිරීමෙහි ලා ඒබ්‍රහම් මාස්ලෝ (Abrahm Maslow) විසින් ඉදිරිපත්කළ අවශ්‍යතා ධූරාවලි න්‍යායෙහි (Hierarchy of Needs Theory) ප්‍රධාන මූලධර්ම භාවිත කරන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 08)

13. "ඉගෙනුම් න්‍යායන් ගුරුවරුන් හට ඉගෙනුම් ක්‍රියාවලිය තේරුම් ගැනීමට සහය වේ."

(i.) ඕනෑම ඉගෙනුම් න්‍යායක් තෝරා ගෙන එම තෝරාගත් ඉගෙනුම් න්‍යායෙහි මූලික මූලධර්ම පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii.) ඉහත (i.) යටතේ සඳහන් කළ මූලික මූලධර්ම නාට්‍ය හා රංගකලා/ ස්වභාවික විද්‍යා ගුරුවරයෙකු ලෙස ඔබ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ භාවිත කරන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iii.) තෝරාගත් ඉගෙනුම් න්‍යාය ප්‍රායෝගිකව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ භාවිත කරන විට ඔබට මුහුණදීමට සිදුවිය හැකි අභියෝග දෙකක් **(02)** පැහැදිලි කර එම අභියෝග ජයගැනීමට යෝජනා දෙකක් **(02)** ඉදිරිපත් කරන්න.

(ලකුණු 08)

-හිමිකම් ඇවිරිණි.-